රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 7/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යං
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1988 පෙබරවාරි මස 2

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

නිවාඩු බංගලා
ආයතන සංග්‍රහය - XX වන පරිච්ඡේදය.

(1.) තරුණතර 1:1, 1:2 හා 1:3 උප වගන්ති ඉවත්කර, ඒ වෙනුවට පහත සඳහන් උප වගන්ති ආදේශ කරන්න.

" 1:1 නුවරඑළියේ රජයේ බංගලාව පැරණි දුම්රිය ස්ථානයට පිටුපසින් පිහිටා ඇති අතර, වර්ෂයකට රු: 24,000/= කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියකුට ලබා ගත හැකිය.

1:2 දුම්රිය පාරට ඉහළින් පිහිටි දියතලාවේ රජයේ බංගලා දෙක;
ලොකු බංගලාව වන "අ" බංගලාව වර්ෂයකට රු: 24,000/= කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියකුට ලබා ගත හැකිය.
හපුතලේ පාර අසල ඇති "ආ" බංගලාව; වර්ෂයකට රු: 24,000/= අඩු වැටුපක් ලබන රජයේ නිලධාරියකුට ලබා ගත හැකිය.

1:3 බණ්ඩාරවෙල, බිඳුනුවැව පාරේ පිහිටි රජයේ බංගලාව; වර්ෂයකට රු: 24,000/= කට අඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකුට මෙම බංගලා ලබා ගත හැකිය. "

(2.) තරුණතර 6:1 උප වගන්තිය ඉවත්කර, ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කරන්න.

" 6:1 ගාස්තු ප්‍රමාණය - නැවතීම සඳහා කුලිය පහත සඳහන් පරිදි වේ.

| | දෛනික කුලිය |
|---|---|
| | රු: ශත |
| නුවරඑළිය | 60 . 00 |
| දියතලාව 'අ' | 60 . 00 |
| දියතලාව 'ආ' | 50 . 00 |
| බණ්ඩාරවෙල | 50 . 00 |

බංගලාවට අයිතිවූද, තමන් පාවිච්චි කරන්නාවූද රෙදි සේදීම සඳහාත්, තමා නතර වී සිටින කාලය තුල පාවිච්චි කරන විදුලි බලය සඳහාත්, බංගලාවේ නතරවන තැනැත්තා වෙනම මුදල් ගෙවිය යුතුය. "

(3) මෙම චක්‍රලේඛයේ විධිවිධාන 1988.04.01 දින සිට බලපාන පරිදි ක්‍රියාත්මක වේ. ආයතන සංග්‍රහයට අදාළ සංශෝධනයන් යථා කාලයේදී නිකුත් කරනු ඇත.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය